**සේසිරි විජේසේකර**

# අතීතයෙන් ඇසෙන කවි

හොරණ සිට පැපිලියාව හරහා කොළඹ එන බසයකට අපේ සුප්‍රසිද්ධ කවියෙක් ද ගොඩවුණෝය. බසයේ ආසන හිස්ව නොතිබුණ හෙයින් ඔහුද පොල්ලේ එල්ලීගෙන සිටියේය. උදේ අටයි කාල වනවිට ඔහු සේවය කරන තැනට යා ගන්නට ඕනෑ නිසා බසයේ වේගය ටිකක් වැඩි කරන ලෙස බසේය රියදුරුට කීය.

''මහත්තයා එහෙම බස් එලවන්න බැහැ. කවියක් කීවොත් ටිකක් ඉක්මනට යන්නම්. රියදුරු තමන් හඳුනන කවියාට කීය. මේ කවියා උපනන්ද බටුගෙදර එක් අතකින් පොල්ලේ එල්ලීගෙන මේ ක්‍ෂණික කවිට කීය.



අටකුත් පහටළාවට තරමට      මරදාන
දුටහොත් වැඩක් වෙයි ඉන් තැනඅනුමාන
මට කඩිමුඩි මදියි බස් එක      යනගාන
හැටටම පෑගුවොත් යහපති      පියසේන

රියදුරු බසයේ වේගය වැඩි කළේය. හිතුවටත් වැඩිය කලින් ඔහු සේවා ස්ථානයට පැමිණියේය.

බටුගෙදර කවියා සිය නෝනාගේ ගෙදර යන සෑම විටකම ඔහුගේ දඟකාර නෑනා කවි කියන්නැයි කියා ඔහුට කරදර කරනවා. දවසක් කවි ඉල්ලා කරදර කරනවිට ඇයට මෙසේ කීය.

ඔච්චම් ඉඟි පස්ස විසි කරමින්      නෑරේ
මෙච්චර මේක සැර වූයෙන් හද      පෑරේ
කොච්චරවත් වදේ මෙහි එන එන      වාරේ
කොච්චිද ගම්මිරිස් දැයි මට නොම      තේරේ

සාර වීර ගති ඇති මුත් සුදු      මූණෝ
කාරණා කාරියක් මෙනි ගම්      මානේ
වාරයකට නොමැති ඔබෙ කට මගේ      නෑනේ
මාරකට් එකට දෙවැනිද      මරදානේ

මීමන ප්‍රේමතිලක කවියාත් උපනන්ද බටුගෙදර කවියාත් අඹ යාළුවෝය. පාසල් යන අවදියේ නැවතී සිටියේ අනන්දය අසල කාමරයකය. එක් නිවාඩු කාලයකදී උපනන්ද සිය ගම බලා ගියා. මීමන කාමරයේ නැවතී සිටියා. උපනන්දට සිය යාළුවා නොදැක ලොකු කාන්සියක් ඇතිවෙලා පි. සී. පතක් ගෙන මේ කවි දෙපදය ලියා මීමනට යැව්වා.

''අමරැස් නිදානය මගේ පෙම්බර      තිලකෝ
මගේ ඇස් සනසවන හැටි හැකිනම්      කියකෝ
''

අඟහරුවාදා මේ තැපැල්පත මීමන අතට ලත් වහාම ඔහුගේ පිළිතුරු තැපැල් පත එවෙලේම යැවිණ.

''නෙත් අස් වැසුම ලපනට ඉත මිත      මැණිකෝ
බුරහස්පතින්දටවත් කොළඹට      වරකෝ

පී.බී. අල්විස් පෙරේරා කිවිඳු එදවස කඩවසම් තරුණයෙකි. දිනක් මහා කවි බොරලැස්ගමුවේ ජී.එච්. පෙරේරා මහතා හමුවීමට කලින් දන්වා රත්තනපිටියේ ඔහුගේ නිවසට යෑමට ගියේය. මහ කවි ජී.එච්. පෙරේරාගේ නිවසින් එහා එදවස තිබුණේ වන ලැහැබින් වටවුණ පැල්පත්ය.

පී.බී. ගේ පැමිණීම බලාපොරොත්තුවෙන් ආලින්දයේ සිටි මහකවි ජී.එච්. - පී.බී. සිය නිවස පසුකොට යන බව දැක ඔහුට කවිය කීයේය.

නිල් සරමකුත් ඇඳගෙන මනමාල      පහේ
අල්විස් පෙරේරෝ උඹ යන්නෙහිද      කොහේ
වල් ඇලිසලාගේ ගෙට යන පාර      ඔහේ
කිල්ලට අහු නොවෙයි ඇවිදින් ගියොත්
මෙහේ

දිනක් හික්කඩුවේ බී.එච්. අමරසේන කවියා ගේ ඇරයුමක් අනුව හික්කඩුවේ පැවති කවි රැස්වීමකට සහභාගිවීමෙන් අනතුරුව පී.බී. රාත්‍රී භෝජනය සඳහා බී.එච්. අමරසේන කවිඳුගේ නිවසට ගියේය. රාත්‍රී භෝජනයෙන් පසු පී.බී. ට කවියක් කියන ලෙස අමරසේන කවියාගේ බිරිය ඇරයුමක් කලාය. කිරි හෙ-ාද්දට ලුණු මදිබව පී.බී. ක්‍ෂණික කවියෙන්ම මෙසේ ඇගෙව්වේය.

රැහුණෝ ඇට සහල් සමගිනි සුවි      සුද්ද
හොඳ හැටි අනාගත් විට මේ කිරි      හොද්ද
තව කිව යුතුද එය කොතරම්      රසවත්ද
ලුණු ලේවාය දැන් හම්බන්තොට      නැද්ද

දිවයිනේ සුප්‍රසිද්ධ කවීන් සහභාගි වූ සාදයකදී එහි ගිය මීමන ප්‍රේමතිලක කවියාට කවියක් කීමට ආරාධනා කළේය. මීමන මේ කවිට කියා ඇඟ බේරා ගත්තේය.

මල් පාවාඩ මත නැටවෙවු කින්      නළඹ
අල්විස් පෙරේරා වැනි කවියන්      කොළඹ
තොල් කට මදිද්දී හොඳ ගානට      එළඹ
සෙල්විය යුතුද මගෙ ෂරසවියගෙ      සළඹ

වල්ගම සෝමතිලක කවියාගේ දියණියගේ විවාහ මංගල දිනයේ දිවයිනේ කවි කිවිඳියෝ බොහෝ දෙනෙක් පැමිණ සිටියහ. කවියක් කීමට බටුවන්දර ගුණවර්ධන කිවියාණන්ට කළ ඇරයුමකට බටුවන්දර මෙසේ කීවේය.

මඟුලක් කෑ නිසා ළඟදි ඔබම      වගේ
සීයා කෙනෙක් සුරතල් මිණිපිරිය      කගේ
මිනි මුණුබුරන් එල්ලෙන විට අපගෙ      ඇගේ
ඉවරයි සෝමෙ සමනල කවි කියපු      යුගේ




**සහන් වීරසේකර**



# තාප්පයෙන් පැන්න බර්ඩ්

එංගලන්තයේ යෝර්ක්ෂයර් ප්‍රාන්තයේ ආරම්භක පිතිකරුවෙක් වූ හැරල්ඩ් ඩිකී බර්ඩ්, වසර 5 ක් ලෙස්ටර්ෂයර් ප්‍රාන්ත පිල නියෝජනය කොට, ක්‍රිකට් විනිසුරු වෘත්තිය තෝරාගත්තේය. බර්ඩ් උපන්නේ 1933 දීය. ඉතාමත් චාම් ගති පැවතුම්වලින් හෙබි මොහු සැමවිටම සිනාමුසු මුහුණින් සිටීම නිසාවෙන්ම ඩිකී බර්ඩ් මහත් ජනප්‍රියත්වයට පත්විය.

ක්‍රිකට් ක්‍රීඩාවත්, ක්‍රීඩකයන්ටත්, අසීමිත ආදරයක් දැක්වූවෙකි ඩිකී බර්ඩ්. 1970 සිට 1997 දක්වා ටෙස්ට් ක්‍රිකට් විනිසුරුවෙක් ලෙස හේ කටයුතු කළේය. ඓතිහාසික එංගලන්තයේ ලෝඩ්ස් ක්‍රීඩා පිටියේදී විනිසුරුවරයෙක් ලෙස බොහීස්ම ලබාගත් බර්ඩ් සිය අවසන් ටෙස්ට් තරගයවූ ඉන්දීය * එංගලන්ත තරගය විනිශ්වය කළේද ක්‍රිකට් ක්‍රීඩාවේ රන් දෙවොල ලෙස සැලකෙන ලෝඩ්ස් පිටියේමය.



ණීමගෙ පරම විනෝදදාංශය ක්‍රිකට් ක්‍රීඩාවයි෴ ගිය වසරේ ලෝඩ්ස් පිටියේදී ඔහුට මුණගැසුණු වර්තමාන ඕස්ට්‍රේලියානු ක්‍රිකට් විනිසුරු ෆිලිප් ගිල්ලෙස්පී සමග ඔහු පවසා තිබුනා. 2015 අළු බදුන ක්‍රිකට් ශුරතාවය අතර මේ අපුරු මුණ ගැසීම සිදු උනා. මෙන්න ඩිකී කියපු ඇස් කැරකැවෙන කතාව.

ඩිකී බර්ඩ් අරුම පුදුම අපූරු චරිතයකි. වචනයේ පරිසමාප්ත අරුතෙන්ම මහත්මයෙක් වූ මොහු, තරගයක් විනිශ්ච කිරීම සඳහා නිවසින් පිටත්වන්නේ උදේ 6.00 ට පමණය. ලෝඩ්ස් ක්‍රීඩා පිටියේ දොරගුළු වසා තිබු මොහොතක උදෑසන 6.30 ට පමණ එම ක්‍රීඩා පිටියේ තාප්පයට නැග ක්‍රීඩාපිටියට ඇතුළුවීමට ගත් උත්සාහයකදි ඔහුට මේ අකරතැබ්බයකට මුහුණ දීමටද සිදුවි තිබෙනවා. පොලිස් භටයෙක් ඔහු අල්ලා ගෙන ප්‍රශ්න කරනවිට තමා බර්ඩ් බවත් මෙම තරගයේ විනිශ්චයකරු තමා බවත් පවසා තිබෙනවා.

කුකුල් කෙන්තිකරයකු වූ පොලිස් නිලධාරීවරයා මහත් සේ කෝපයට පත්ව කියා ඇත්තේ "තමුසෙ මීළඟට කියාවි, තමුසෙ එංගලන්තයේ මහා රාජිණිය බව. අනේ මගේ කට...නගිනවා නගිනවා." පොලිස් රථය ලෝර්ඩ්ස් ක්‍රීඩාංගනය අසලින් නික්ම ගියේය.

ක්‍රිකට් ක්‍රීඩාවට ඔහු කළ අමිල සේවය අගයමින්, එලිසබෙත් මහා රැජණ ඔහුට එම්. බී. ඊ. ගෞරව නම්බු නාමය පිරිනමන ලදී. නිල උත්සවය පෙරවරු 11.30 ටය. ඩිකී බර්ඩ් බකිංහැම් මාලිගාවට ගියේ පෙරවරු 6.30 ටය. රැකවල්ලා සිටි නිලධාරියා ඩිකි බර්ඩ්හට ඇතුළුවන්නට අවසර ලබානොදිණ. මේ නිසා මාලිගය අසල කඩයක පැය 5 ක පමණ කාලය ගත කළේය.

"ක්‍රීඩාවට කැපවී සිටින්න. ඉතාමත් අඩුවෙන් වැරදි කරන විනිසුරු හොඳ විනිසුරුවෙක්. වැරදිම සාමාන්‍ය ගතියක්" ඩිකී බර්ඩ් පැවසීය.

බර්ඩ්ට මුළු ලොවම ආදරෙයි. ඔහු මුළු ජීවිතය තුල කසාදය ද දික්කසාදයද වුයේ ක්‍රිකට් ක්‍රීඩාවයි. ජීවිත පෙළවාසියට වඩා ක්‍රිකට් වලට ආදරය කල සුන්දර බර්ඩ්ට නිරෝගී සුව පතමු.